## 2022 අප්‍රේල් මස 21 දින පැවති සෞඛ්‍ය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව

**කමිටු සාමාජිකයන්**

1. සුසිල් තිලකරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. එම්.පි.එම්.අන්සාර් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. සුරංගී ආර් සමරතුංග මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ආර්.ඒ.විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. එච්.බි.සිතා හේරත් මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිණීම**

1. එච්.බි.සිතා හේරත් මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩි.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. වෛද්‍ය ප්‍රදිප් නන්දදාස මහතා - නාගරික පශු වෛද්‍ය නිලධාරි
3. ජයනී රාජකරුනා මිය - නාගරික ගණකාධිකාරි
4. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
5. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
6. ජී.වි.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
7. එම්.ජී.සි.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. එස්.අයි.සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(පාලන)
9. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
10. ජේ.බි.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණීම**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩි.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. වෛද්‍ය ප්‍රදිප් නන්දදාස මහතා - නාගරික පශු වෛද්‍ය නිලධාරි
3. ජයනී රාජකරුනා මිය - නාගරික ගණකාධිකාරි
4. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
5. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි

1. මහා නගර සභාවේ නාගරික පශු වෛද්‍ය නිලධාරි වෛද්‍ය ප්‍රදිප් නන්දදාස මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මහා නගර සභාව මගින් නගරයේ ප්‍රජාව වෙනුවෙන් කරන සේවාවන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරිම සඳහා අඩුපාඩුවක්ව පවතින දැන්වීම් පුවරුවක් / ප්‍රදර්ශන පුවරුවක් කාර්යාලය ඉදිරිපිට භූමියේ සවි කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කර ඇති ඉල්ලීම.
   මෙම ඉල්ලීම පිළිබඳ අවධානය යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු/නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

2. අනුරාධපුර, ගල්කුලම, අක්කර 50, වේවැල්දිගිලිය, ඩබ්.ඒ.ශිරාන් මනෝජ් ප්‍රියකාන්ත මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මිරිදිය මත්ස්‍ය වෙළඳ සැලක් පවත්වා ගෙන යාම සඳහා ස්ථානයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   මහා නගර සභාවේ ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ පමණක් ලබා දෙන බව කමිටුව නිර්දේශ කර ඇත. එබැවින් ලබාදිමට ස්ථානයක් නැති බව ඩබ්.ඒ.ශිරාන් මනෝජ් ප්‍රියකාන්ත මහතා වෙත දැනුම්දීමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

3. පළාත් පාලන දෙපාර්තමේන්තුව,නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්,ඩබ්.එම්.යූ.විරසිංහ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් දිවයින පුරා කොස් පැළ 100,000 ක් රෝපණය කිරිමේ වැඩසටහන යටතේ පළාත් පාලන ආයතනවල අවධානය යොමු කරන මෙන් දන්වා එවා ඇති ලිපිය.
   ඉහත කාර්ය 2022.11.02 හා 03 දිනට පෙර සුදානම් කිරිමට උද්‍යාන අලංකාර නිලධාරි වන්නිනායක මහතාහට යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

4. පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සහකාර කොමසාරිස් (අනුරාධපුර), එල්.එච්.වී.ඉරෝෂණී මහත්මිය විසින් ලිපියක් යොමු කරමින් අනුරාධපුර, යාපනය හංදිය, නිවත්තකචේතිය පාර, සමන් මංජුල ද සිල්වා මයා විසින් යාපනය හංදියේ එළවළු වෙළඳාම් කටයුතු වසර 07 ක කාලයක සිට කර ගෙන යන අතර ආදායම් බදු ගෙවන බව සඳහන් කර ඇත. මොහුගේ එළවළු ව්‍යාපාරය අසල අනවසර ඉදිකිරිම් සම්බන්ධව පැමිණිලි කර ඇත. මෙම ගැටළුව නිරාකරණය කිරිම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත්ද යන්න වාර්තාවක් එවන ලෙස දන්වා එවන ලද ලිපිය.
   ඉහත කාර්ය පිළිබඳ කඩිනමින් ස්ථාන පරික්ෂනයක් සිදු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු / නාගරික ගණකාධිකාරි)

5. උලපනේ, ගම්පොල පාර, අංක:119, මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) ආයතනය විසින් ලිපිය සහ ව්‍යාපෘති වාර්තාව යොමු කරමින් දකුණු බහුවිධ ප්‍රවාහනය මධ්‍යස්ථානය (අනුරාධපුර නව බස් නැවතුම්පල) ඉදිකිරීම් කටයුතු නිසා සිදුවන ගැටළුවලට පිළියම් ලෙස සැකසූ රථවාහන කළමනාකරණ සැළැස්ම රථවාහන කමිටුව වෙත ඉදිරිපත් කිරිමට පෙර ඒ පිළිබඳ මහා නගර සභාව විසින් දක්වන අදහස් හා යෝජනා මෙම ආයතනය වෙත එවන ලෙස කර ඇති ඉල්ලීම.
ඉහත කාරණය සඳහා අදහස් හා යෝජනා ලබා ගැනිමට මාර්ග සංවර්ධන අධිකාරිය,මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,රථවාහන පොලිසිය,මෙම කමිටු සාමාජිකයන් සහ නාගරික කොමසාරිස්තුමා ඇතුළු ගරු නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්විමට තීරණය විය. (වගකිම - පරිපාලන නිලධාරි)

6. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් යසසිරිපුර ට්‍රාන්ස්පෝමරය සිට මල්වතු ඔය දකුණු පැත්තේ තිබෙන කාණු පද්ධතිය මල්වතු ඔය දෙසට කපා සකස් කර දෙන ලෙස කල ඉල්ලීම. එම ඉල්ලීම පිළිබඳව අධික්ෂණය කර, මල්වතු ඔය දෙසට කාණු පද්ධතිය කැපිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

7. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් දහයියාගම හංදිය සිට කඩ පෙළ ඉදිරියෙන් දුම්රිය මාර්ගය පසු කර බංඩා බැටල් ආයතනය ඉදිරිපිට මල්වතු ඔය දක්වා කාණු පද්ධතියක් ඉදිකරන ලෙස කර ඇති ඉල්ලීම. මෙම ඉල්ලීම පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

8. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් පවිත්‍රපුර ප්‍රදේශයේ ජලය එක් රැස්වි පවතින බැවින් එම කාණු පද්ධති සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස කල ඉල්ලීම. කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර සකස් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

9. ගරු නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් අභය පෙදෙස අංක 01 ප්‍රජා ශාලාව ඉදිරිපිට කඩ පේළියේ වෙළඳුන් විසින් කුෂන් කැබලි ගොඩ ගසා පුළුස්සනවා දක්නට ලැබෙන බැවින් මේ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස කල යෝජනාව. මේ පිළිබඳ පරික්ෂා කර පියවරක් ගැනිමට තීරණය විය. (වගකිම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

10. ගරු නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් අංක 01 ප්‍රජා ශාලාව අසල මාර්ගය අවහිර කරමින් ත්‍රීවිල් රථ අළුත්වැඩියා කටයුතු කර ගෙන යන බැවින්, මේ සම්බන්ධව පියවර ගන්නා ලෙස කල ඉල්ලීම. මෙම ඉල්ලීම පිළිබඳ පරික්ෂා කර බලා කටයුතු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු/නාගරික ගණකාධිකාරි)

**<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>**

- ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා විසින් 251 කොට්ඨාශ ප්‍රතිපාදන මගින් ඩී.එස්.සේනානායක විද්‍යාලය සහ ශාන්ත ජෝශප් විද්‍යාලය,ශික්ෂණ රෝහල දක්වා ප්‍රධාන මාර්ගය දෙපස රොබරෝසියා පැල සිටුවීමට කල යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිම.

සුසිල් තිලකරත්න,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.